# ආත්තෝට මමයි



කවිනි නිහින්සා මෙනන්

# ආත්තොයි මමයි

කවිනි නිහින්සා මෙනන්

**වෙනත් කෘති**

- මගේ යාළු මාළුවා නැතිවුණ හැටි
- මගේ අරුම පුදුම දත් දෙක
- Ginger the cat

2025 February 08
ISBN 978-624-208-208-0

# පිදුම

මට හැමදාම ආදරය කරන අම්මා, තාත්තා, අක්කා ඇතුළු පවුලේ සැමටත්, මගේ සියලුම යහළුවන්ටත්, මට ලස්සනට සිංහල අකුරු ලියන්න කියවන්න කියාදුන්න වාසනා ගුරු මෑණියන්ටත්, මට ඉගැන්වූ සියලුම ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ටත් මගේ මෙම නිර්මාණය වන “**ආත්තොයි මමයි**” කතාව බැති සිතින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



ආත්තො කියන්නේ කවුද?

අපේ ආත්තො මගේ අම්මාගේ අම්මා. මගේ ආත්තො සුදුම සුදුයි. හරියට අළුවා කෑල්ලක් වගේ. නැහැ... නැහැ... ඊට වඩා සුදුයි.


ආත්තොට දරුවෝ හතර දෙනෙක් ඉන්නවා. මගේ ලොකු මාමා තමයි ආත්තොගේ සුදු මහත්තයා. ආත්තොගේ නෝනා අපේ ලොකු අම්මා. අපේ පුංචි අම්මා ආත්තොගේ චූටි. එතකොට අපේ අම්මා තමයි ආත්තොගේ සූකිරි.



ආත්තොට තියෙන ලෙඩ

අපේ ආත්තොට තියෙන්නේ එකම ලෙඩයි. ඒ තමයි කකුල්වල හන්දි අමාරුව. වෙන ඉහෙන් බහින ලෙඩක් නෑ කියලා තමයි ආත්තො කියන්නේ.

හැබැයි මමත් ආත්තොගෙ ගානට හෙමින් ඇවිදිනකොට දිනන්නේ ආත්තොම තමයි.



ආත්තොගේ ආදරය

මට නම් හිතෙන්නේ අපේ ආත්තො තරම් අපි හැමෝටම ආදරය කරන්න වෙන කාටවත් බැහැ. ඒ තරම් ආත්තො අපට ආදරෙයි

එතකොට අපි කොහාම ද අපේ සුදු ආත්තොට ආදරය නොකරන්නේ.




ආත්තොගේ රස කෑම

අපේ ආත්තොගේ රස කෑම වලට කවුරුත් ආසයි. ආත්තො හැමතිස්සේම අපිට දෙන්නේ ගුණ වගේම රස කෑම.

ඒ අතරින් මම කැමතිම අත්තොගේ කිරි බතටයි. මාළු ඇඹුල් තියලටයි. එතකොට ආත්තොගෙ රසම රස පරිප්පු හොද්ද පාන් කන්න කියාපු හොද්දක්.

ඒවා කොච්චර කෑවත් මගේ බඩ පිරෙන්නේ නැහැ.



## ආත්තො එක්ක සෙල්ලම්

මම පාසල් ඉවර වෙලා ඇවිත් පොත්වල වැඩ ඉවර වුණු ගමන් කැමති ආත්තොත් එකක් සෙල්ලම් කරන්න.

ඒ සෙල්ලම් වලදී ආත්තො තමයි මගේ බබා. මම ආත්තොට කවනවා, පොවනවා. ආත්තො තමයි මේ ලෝකේ හොඳම බබා.

තවත් වේලාවක මම චිත්තයක් ඇඳගෙන ආත්තොගේ අත්තම්මා වෙනවා. හැබැයි මට චිත්තය අන්දවන්නේ ආත්තො.



## ආත්තොගේ උපදෙස්

ආත්තොගෙන් මට ලැබෙන උපදෙස් වලින් නම් අඩුවක් නැහැ.

''මැණිකේ... ඉක්මණට ඇදුම් මාරු කරගෙන මූණ සෝදගන්න''

''මැණිකේ... පුටුවේ බත් හලන්නේ නැතුව කන්න''
''මැණිකේ... පඩිපෙලේ දුවන්නේ පරෙස්සමෙන්''
උපදෙස්, උපදෙස් කොයි වෙලෙත් උපදෙස්.


ඒත් එහෙම හිතන්න හොඳ නැහැ. ආත්තො එහෙම කියන්නේ මට ආදරේ නිසානේ.




ආත්තොගේ දක්ෂකම්

අපේ ආත්තො ගොඩක් ලස්සන දේවල් හංගාගෙන ඉන්නේ. ඒ එකක් තමයි ආත්තොට ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන් වීම.

මම චිත්‍ර තරඟවලට අඳිනකොට ආත්තොගෙ ලස්සන ලස්සන චිත්‍ර මතක් වෙනවා. ඒ අතර ලස්සන මිනිස් රූප, මල් වර්ග ගොඩාක් තියෙනවා.



ආත්තො අපිව බේරන හැටි

මම සමහර දේවල් පන්තියේ අමතක කරලා එනකොට අම්මා මට බනිනවා. ''ඇයි මැණිකේ වතුර බෝතලය දාලා ආවේ. ආයේ නම් අළුත් වතුර බෝතලයක් අරන් දෙන්නේ නැහැ''

එතකොට මම හයියෙන් අඬනවා.

''අඬන්න එපා මයෙ මැණිකේ. අම්මා ඇත්තනේ කියන්නේ ආයේ ඉස්කෝලේ ඇරිලා එනකොට මුකුත් දාලා එන්න එපා''

ආත්තො එහෙම කියන්නේ මාව උකුලට අරගෙන. මගේ ආත්තො කොච්චර හොඳද?



දඟකාර ආත්තො

අපේ ආත්තො මිදුලට වෙලා මාමට ෆෝන් එකෙන් කතා කර කර හිටියා. ඒ ඉන්න ගමන් ඒ ගාව හිටපු ''ජින්ජර්'' කියන පූස් තඩියාගේ ඔළුව අතගෑවා. පැනපු ගමන් ''ජින්ජර්'' හැපුවනේ ආත්තොගේ අත. ඒ අතට ගොඩක් ඉන්ජෙක්ෂන් ගහන්නත් වුණා.

තවත් දවසක් ආත්තො පඩිපෙළ දිගේ වේගයෙන් එනකොට වැටිලා ඔලුව පැලුණා. මැහුම් හතක් දාන්නත් වුණා. බලන්න අපේ දඟකාර ආත්තො කරගන්න දේවල්.
ඒ වගේම මැහුම් දානකොට හරි ගලවනකොට හරි අපේ ආත්තො පොඩ්ඩක්වත් අඬලා නැහැ.



අපි ආත්තොට ආදරෙයි

අපේ ආත්තොට මිණිපිරියොම හතර දෙනයි. සුද්දි අක්කයි, අපේ අක්කයි, දෝණි අක්කයි, මමයි.

අපේ ආත්තො අපි හතරදෙනාටම එක වගේ ආදරෙයි. අපි ආත්තොට ඊට වඩා ආදරෙයි. අපි පුලුවන් හැමවෙලේම ආත්තොට උදව් කරනවා.



## ආත්තොගේ විනෝදාංශ

ආපේ ආත්තොට ඇවිදින්න අමාරු නිසා ආත්තොගේ විනෝදාංශ ගොඩක් කරන්නේ වාඩි වෙලා.

ආත්තොගේ පළවෙනි විනෝදාංශය පොත් පත්තර කියවීම. ආත්තො තරම් වේගයෙන් අපේ ගෙදර කාටවත් පොත් කියවන්න බැහැ.

දෙවෙනි විනෝදාංශය රූපවාහිනිය බලන එක. තුන්වෙනි විනෝදාංශය මම හිතන විදිහට මාත් එක්ක සෙල්ලම් කරන එක.



ආත්තො එක්ක සවාරියක්

ආත්තො එක්ක විනෝද සවාරි යන්න අපි හරි ආසයි. අමාරුවෙන් හරි ආත්තො ඒ ගමන් වලදී අපිත් එක්ක විනෝද වෙනවා.

එක සැරයක් අපි මුහුදු වෙරළට ගිහින් එනකොට අපේ අලුවා කැටේ අව්ව සැරට හොඳටම පිච්චිලා. ඒත් ටික දවසකින් අපේ ආත්තො අයෙත් සුදු වුණා.

අපේ ආත්තොට තෙරුවන් සරණයි

නිමි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්